# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2022.07.26

වේලාව : පෙ.ව.9.30

ස්ථානය : ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව

මුලාසනය : ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මහත්මිය (ප්‍රධාන ලේකම්)

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

01) පී.සෝමසිරි මහතා - ආණ්ඩුකාර ලේකම්

02) තිලක් සෙනරත් මහතා - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

03) යූ.බී.ආර්.රාජපක්ෂ මහතා - සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප)

04) ඒ.ඩී.එස්.සදීකා මිය - ලේකම්,පළාත් පාලන අමාත්‍යාංශය(බ.ප)

05) සිරිසෝම ලොකුවිතාන මහතා - ලේකම්,අධ්‍යාපන අමාත්‍යාංශය(බ.ප)

06) කේ.චම්පා එන්. පෙරේරා මිය - ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශය(බ.ප)

07) ගාමිණී ධර්මසේන මහතා - ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය(බ.ප)

08) චන්දන රණවීර ආරච්චි මහතා - ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය(බ.ප)

09) ඩබ්ලිව්.එම්.දයාවතී මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)

10) ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් ම - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)

11) ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)

12) කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)

13) ජී.ඩබ්ලිව්.පී.පෙරේරා මිය - වැ.බ. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)

14) පාලිත අබේවර්ධන මහතා - ප්‍රධාන නීති නිලධාරී

15) කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

ප්‍රධාන ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | පවත්නා තත්ත්වය මත රාජකාරි කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධව | පසුගිය කාලය තුල පැවති කොවිඩ් තත්ත්වය මත හා වර්තමානයේ පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් කාර්යාල කටයුතු යථාවත් පරිදි පවත්වාගෙන යාමට නොහැකි වූ බවත් නැවතත් කොවිඩ් 19 යළි හිස ඔසවමින් පවතින තත්ත්වයක් මත හා පවතින ඉන්ධන අර්බුදය මත රාජකාරි කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සිදු කල යුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. මේ අනුව පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් නිලධාරීන්ගේ පැමිණීම සම්බන්ධයෙන් ගත්කල රාජකාරී පවත්වාගෙන යාමේදී පැන නැගී ඇති ගැටළු තත්ත්වයන් මත අමාත්‍යාංශ හා සියලුම ආයතනවල කටයුතු පවත්වාගත යුතු වුවද පළාතක් ලෙස ආයතනික වශයෙන් බලාපොරොත්තුවන දැක්ම හා මෙහෙවර ළඟාකර ගැනීම සඳහා අමාත්‍යාංශවල අරමුණු පරමාර්ථ සමඟ සේවාවන් නොපිරිහෙලා කාර්යක්ෂමව ඉටු කිරීමට කටයුතු කිරීම සියලුම ලේකම්වරුන්ගේ කාර්යය භාරයක් බව ප්‍රධාන ලේකම් විසින් කරුණු පැහැදිලි කරන ලදී.<br><br>ඒ අනුව නිලධාරීන් තුල පවතින ආකල්ප සිතුම් පැතුම් වෙනස් කරමින් විධිමත් පරිදි කාර්යාල කටයුතු පවත්වාගෙන යාමට සියලුම ලේකම්වරුන් පියවරගත යුතු බවත්, එමෙන්ම කොවිඩ් 19 වසංගත තත්ත්වය නැවත ව්‍යාප්ත වීමත් සමඟ තම කාර්යාල තුල පෙර පරිදිම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමෝපායන් අනුගමනය කිරීමට හා මුඛ ආවරණ පැළඳීම අනිවාර්ය කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 02. | කාර්යාල කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධව | මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සඳහා පළමු අදියර වශයෙන් එක් එක් ආයතන මට්ටමින් දත්ත ඇතුලත් කර අවශ්‍ය මූලික තොරතුරු ලබා ගැනීම සඳහා විමසුම් (Query) සකස්කර පරිශීලන අතුරු මුහුණතක් (Dashboard interface) සකස්කර අවසන්කර 2022.07.31 දිනට පෙර භාර දෙන ලෙස කර්නල් රසික කහඳ ගමගේ මහතා එකඟ වී තිබූ නමුත් ඔහු ඒ සඳහා නැවත 2022.12.31 දින දක්වා කල් ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදුකර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>මේ සම්බන්ධව ආණ්ඩුකාරතුමාට ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලෙස හා කල් ලබා දීමට සිදුවන්නේ නම් ඒ සඳහා ගෙවීම් සිදු නොකර කල් ලබා දීමට කටයුතු කරන බවද ලිඛිතව රසික කහඳ ගමගේ මහතා වෙත දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 03. | කෘෂිකර්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව | කෘෂිකර්ම ක්ෂේත්‍රය තුල පවතින ආහාර නිෂ්පාදන ක්‍රමවේදයන් බස්නාහිර පළාත තුල වර්ධනය කිරීම සම්බන්ධව කෘෂි ප්‍රවර්ධන වැඩසටහන මඟින් උපදෙස් ගණනාවක් ලබා දී ඇති බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව කෘෂි ප්‍රවර්ධන වැඩසටහන් යටතේ,<br>✓ කෘෂි නිෂ්පාදන වල ඵලදායීතාව වැඩි කරන්නේ කෙසේද යන්න සම්බන්ධව,<br>✓ ආයතන , පාසැල් හා ගෘහස්ථ ගෙවතු වගා වැඩසටහන් සාර්ථකව සිදු කරන්නේද කෙසේද යන්න සම්බන්ධව,<br>✓ රජයට හිමි ඉඩම්වල ගෙවතු වගා සිදු කිරීම සම්බන්ධව,<br>✓ ආදර්ශ ගොවිපළවල් යටතේ පවතින ගොවිපළවල් නවීන ගොවිපළවල් බවට පත් කිරීම සම්බන්ධව,<br>✓ කෘෂිකර්ම අමාත්‍යාංශයට ලබා දී ඇති ප්‍රතිපාදන යටතේ ගොවීන් වෙත කෘෂිකර්ම කටයුතු සඳහා අවශ්‍ය කෘෂි උපකරණ ලබා දීම සම්බන්ධව,<br>✓ කෘෂිකර්ම කටයුතු සඳහා අවශ්‍ය ජලය සම්පාදනය කිරීම වෙනුවෙන් වාරිමාර්ග ප්‍රවර්ධන සඳහා කටයුතු කිරීම සම්බන්ධව (ඇළ වේලි සංවර්ධනය ),<br>✓ ඵලදායිතාව වැඩි කිරීම සඳහා පුරන් කුඹුරු හා වගා නොකල ඉඩම් වගාවට නැඹුරු කර ගැනීම සම්බන්ධව,<br>✓ අතිරේක බෝග ප්‍රවර්ධනය සම්බන්ධව ,<br>✓ බස්නාහිර පළාත තුල ආහාර හිඟයක් ඇති වුවද එම හිඟය නැති කිරීම සඳහා අනිකුත් පළාත් තුළ නිෂ්පාදන අතිරික්තය බස්නාහිර පළාත වෙත ගෙන්වා ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව,<br>✓ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් බිත්තර වී හා අනිකුත් බීජ වර්ග ලබා දීම සම්බන්ධව,<br>✓ කාබනික පොහොර කෙරෙහි අවධානය යොමු කිරීම සම්බන්ධව,<br>යන කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද බව ප්‍රධාන ලේකම් විසින් දැනුවත් කරන ලදී.<br>තවද වගා කටයුතු සඳහා දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික්කයකට ලක්ෂ 1 බැගින් ගෙවතු ලක්ෂ 03 ක් වගා කටයුතු සඳහා යොදා ගත යුතු බවට එම කෘෂි ප්‍රවර්ධන රැස්වීමේදී වැඩි දුරටත් සාකච්ඡා කරන ලද බව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කල අතර , ගම්පහ දිස්ත්‍රික්කයේ ගෙවතු 70000 ක් ද, කළුතර දිස්ත්‍රික්කයේ ගෙවතු 54475 ක්ද , කොළඹ දිස්ත්‍රික්කයේ ගෙවතු 58200 ක් වශයෙන් බස්නාහිර පළාත තුළ ගෙවතු 182675 ක ප්‍රමාණයක් වගා කටයුතු සඳහා යෙදවීමට මේ වන විට කටයුතු කර ඇති බවත් ඉදිරියේදී ඉතිරි ගෙවතු ප්‍රමාණය සම්පූර්ණ කිරිමට කටයුතු කරන බවත් කෘෂි කර්ම අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු දක්වන ලදී. ඒ සමඟ සෑම දිස්ත්‍රික්කයක් තුලම පර්චස් 20 ක පමණ ගෙවත්තක් ආදර්ශ ගෙවත්තක් ලෙස සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ද එම රැස්වීමේදී කරුණු සාකච්ඡා කල බව කෘෂි කර්ම අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>තවද බස්නාහිර පළාතට අයත් කොරතොට ප්‍රදේශයේ පිහිටි ඉඩම මේ වන විට වගා කටයුතු සඳහා යොදා ගත හැකි පරිදි එළි කිරිමට කටයුතු සිදු කරමින් පවතින අතර ඒ සඳහා වැඩ සැලැස්මක් සකස් කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරනු ලබන බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් |

| | | | |
|---|---|---|---|
| | | තවද බස්නාහිර පළාතට අයත් සන්ෆලවර් විලේජ් හි පිහිටි ඉඩම ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය වගා කටයුතු සඳහා ඉල්ලුම් කරනු ලබන බව පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් පවසන ලදී. තාවකාලික පදනම මත දැනට එම ඉඩම ලබා දී ඇති යුධ හමුදාවට ඉන් ඉවත්වන ලෙස දන්වා ඇති බැවින් ඒ සඳහා යළි සිහි කැඳවීමක් යවන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04. | විදුලිය හා ඉන්ධන පරිභෝජනය අවම කිරීම | විදුලිය පරිභෝජනය අඩු කිරීම මඟින් විදුලි බිල යම් ප්‍රමාණයකින් අඩුවී ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් ප්‍රකාශ කරන ලදී . එමෙන්ම නිවාඩු දිනයක විදුලි විසන්ධි වීමෙන් පසු ක්‍රියාත්මක වූ විදුලි උත්පාදන යන්ත්‍රය නැවත විදුලිය ලැබීමෙන් පසු කාර්මික දෝෂයක් නිසා ස්වයංක්‍රීයව ක්‍රියා විරහිත නොවීම හේතුවෙන් එය ක්‍රියා විරහිත කිරීම සඳහා අදාළ නියෝජිත ආයතනය හා විදුලිබල මණ්ඩලය සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන්ට සිදුවිය. ඒ සඳහා දිගු කාලයක් ගත වීම නිසා විදුලි ජනන යන්ත්‍රයට අධික ඩීසල් ප්‍රමාණයක් වැය වී ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.<br><br>එවැනි අවස්ථාවකදී ගොඩනැගිල්ලට සිදුවිය හැකි දැඩි අලාභහානීන් සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කල අතර එහිදී අදාළ ආයතන කාර්යක්ෂමව ක්‍රියාත්මක නොවීම මෙම ගැටළුවට හේතු වූ බැවින් මෙවන් අවස්ථාවකදී ක්ෂණිකව ක්‍රියාත්මක විය හැකි ක්‍රමවේදයක් සලසා දෙන ලෙසට විදුලිබල මණ්ඩලයට ලිඛිතව දන්වා යැවීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 05. | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය කරදියාන නව ගොඩනැගිල්ලට ස්ථානගත කිරීම සම්බන්ධයෙන් | හදිසි පිවිසුම් දොරටුව අවහිර වන සේ සභාපති තුමාගේ කාමරයද ස්ථානගත කර ඇති අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත **2022.07.01** දින මෙම ගොඩනැගිලි පරිශ්‍රයෙන් ඉවත් වී කරදියාන ප්‍රදේශයේ ඉදිකළ නව ගොඩනැගිල්ලෙන් ස්ථානගත වන ලෙස දන්වා ඇති නමුත් ඔවුන් මේ දක්වා කටයුතු කර නොමැති බවට පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>තවද ඔවුන්ට නව ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය ඉදි කිරීම සඳහා මුදල් සැපයූ නමුත් එම මුදල් වෙනත් කටයුත්තක් සඳහා යොදවා ඇති බවත් වැඩි දුරටත් දැනුම් දෙන ලදී.<br><br>ඒ අනුව නැවත ඒ සඳහා මුදල් ලබා දීමට හැකියාවක් නොමැති බැවින් ඒ සඳහා ක්‍රමවේදයක් සකසා ගන්නා ලෙසත් , එමෙන්ම හදිසි පිවිසුම් දොරටුව අවහිර වී ඇති බැවින් ආරක්ෂක හේතූන් මත ඔවුන්ට නව ගොඩනැගිල්ලෙන් ස්ථානගත වීම සඳහා කටයුතු සූදානම් කරන ලෙස හා නැතහොත් යම් අයුරකින් හානියක් සිදු වුව හොත් ඒ සඳහා සියලු වගකීම අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ නිලධාරීන් විසින් දැරිය යුතු බවත් නැවත ලිඛිතව දැනුම් දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 06. | කාර්යාල ප්‍රවාහන බස්රථවල ආසන වෙන්කර ගැනීම සඳහා කාර්යාල වේලාවේදී පිටතට යාම සම්බන්ධව | කාර්යාල ප්‍රවාහන බස් රථවල ආසන වෙන්කර ගැනීම සඳහා එම බස් රථ වල ගමන් ගන්නා ඇතැම් නිලධාරීන් කාර්යාල වේලාව තුලදී කාර්යාලයෙන් බැහැර වන බවට කරුණු වාර්තා වී ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කාර්යාල වේලාව තුලදී කිසිදු සේවකයෙකුට බස් රථයට ඇතුලු වීමට අවසර ලබා නොදෙන ලෙසත් එසේ ඉඩ ලබාදෙන බස්රථ සම්බන්ධව ක්‍රියා මාර්ග ගැනීමට සිදුවන බැවින් එය වලක්වා ගැනීමට කටයුතු කරන ලෙස බස් රියදුරන් වෙත ලිඛිතව දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 07. | සංචිත වාහන සමූහ රක්ෂණය සම්බන්ධයෙන් | මූල්‍ය චක්‍රලේඛ 03/2019 මඟින් බස්නාහිර පළාත් සභාවට අදාල කරගෙන ඇති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 සහ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ 2018.12.31 දිනැති මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ අනුව සියලුම වාහන සම්බන්ධව තක්සේරු වටිනාකම් මේ වන විට ලබා ගෙන ඇති අතර එම සියලුම සංචිත වාහන රක්ෂණය කිරිමේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබාගෙන ඇති නියෝජිත අංක 78853 යටතේ එම ආයතනයෙන්ම රක්ෂණ කටයුතු සිදු කරන්නේද , ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කල යුතුද යන්න පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් විමසා සිටින ලදී.<br><br>ඒ අනුව මෙ පිළිබඳ දීර්ඝ ලෙස කරුණු සාකච්ඡා කිරීමේ අනතුරුව තරඟකාරී මිල ගණන් යටතේ රක්ෂණ කටයුතු සිදු කිරීමේදී රාජ්‍ය අංශයට ප්‍රමුඛතාවය ලබා දීම ගැටළුවක් නොවන බවට චක්‍රලේඛයක් නිකුත් කර තිබූ බවට කාරුණු ඉදිරිපත් වු අතර , තවද එම නියෝජිත අංකය යටතේ වාහන රක්ෂණය කිරීමේදී ඊට අදාළ කොමිස් මුදල් බස්නාහිර පළාත් සභාව වෙත ලබා ගත හැකි බවටද වැඩි දුරටත් සාකච්ඡා කරන ලදී.<br><br>භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති 2019.08.15 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 06/2019 හා 2019.09.02 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 06/2019 (i) මඟින් අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු විධිමත්ම සිදු කර එම රක්ෂණාවරණය ලබා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.<br><br>ඒ අනුව අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු සහ ආයතනවල වාහන තක්සේරු වටිනාකම පදනම් කර ගනිමින් අදාළ රක්ෂණාවරණය සඳහා මිල ගණන් කැඳවීම සිදු කරන ලෙසත් , යම් හෙයකින් අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව තෝරාගනු ලබන්නේ නම් බස්නාහිර පළාත මඟින් ලබා ගෙන ඇති නියෝජිත අංක 78853 යටතේ පමණක් රක්ෂණාවරණය ලබා ගැනීමට කටයුතු කිරීම වඩා යුදුසු බව තීරණය කරන ලදී. මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 08. | පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් තනතුරින් මුදා හැරීමේදී ඉල්ලීම් ලිපි ප්‍රමාද වී ඉදිරිපත් කිරීම සම්බන්ධව | පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් වෙනත් තනතුරක් බාර ගැනීම සඳහා ස්ථිරවම හා තාවකාලිකව තනතුරින් මුදා හැරීමට අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා එම මුදා හැරීමේ දිනයන් ඉකුත් වී වසර ගණනාවකට පසුව ඉල්ලීම් ඉදිරිපත් කිරීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් මතුව ඇති ගැටළු සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>එසේම පසුව කරන ලද ඉල්ලීම් සම්බන්ධව කොමිෂන් සභාව වග නොකියන බවත් පළාත් රාජ්‍ය කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>ඒ අනුව එසේ නීත්‍යානුකූලව මුදා හැරීමේ ලිපි ලබා නොගෙන නිලධාරීන්ට නව තනතුරේ රාජකාරි භාර ගැනීමට අවස්ථාව ලබා නොදීම සම්බන්ධව එම නිලධාරීන් සේවය කල ආයතනවල ආයතන ප්‍රධානීන් වගකීම බාරගත යුතු බවට සියලු ආයතන වෙත දන්වන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) වෙත දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 09. | විදේශ නිවාඩු ඉල්ලුම් කිරීමේ 14 / 2022 චක්‍රලේඛය සම්බන්ධව | විදේශ නිවාඩු සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14 /2022 සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිඛිත උපදෙස් ඉල්ලා ලිපියක් යොමුකර ඇති අතර බස්නාහිර පළාත වෙනුවෙන් ගිවිසුමක්ද සකස් කරමින් පවතී.<br><br>නමුත් එතෙක් ඉදිරිපත්වන ඉල්ලුම්පත්‍ර කෙරෙහි ද කටයුතු කිරීමට සිදුවන අතර ඒ සඳහා ක්‍රියා කල යුතු ආකාරය පිලිබඳ සාකච්ඡා කරන ලදී. ඒ අනුව විදේශගත වීමකදී දේපළ ණය හැර අනෙකුත් ණය වර්ග ගෙවා අවසන් කල යුතු බවත් , දේපළ ණය සම්බන්ධව විදේශ ගත වූ කාල සීමාව තුල නිලධාරියාගෙන් රජයට සේවයක් සිදු නොවන බැවින් රජයෙන් ගෙවන පොළී ප්‍රතිශතය ගෙවීම් කිරීමට නොහැකි අතර ණය අයකර ගැනීමේදි බැංකුව සමඟ බැඳීමක් ඇති බැවින් ණය ගෙවීම සම්බන්ධව බැංකුව සමඟ එකඟතාවයක් ඇතිකරගෙන බැංකුවෙන් ලබා ගන්නා තහවුරුවක් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බවට තීරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>ප්‍රධාන නීති නිලධාරී |

| | | | |
|---|---|---|---|
| 10. | වෙනත් මාණ්ඩලික නිලධාරියෙකු වෙනුවට "අත්සන් කළේ" ලෙස සදහන් කර වෙනත් නිලධාරියෙකු අත්සන් යොදා යවන ලිපි සම්බන්ධව | "අත්සන් කළේ" ලෙස මාණ්ඩලික නිලධාරියෙකුගේ නම සදහන්කර ඒ වෙනුවට වෙනත් නිලධාරියෙකු අත්සන් කර ලිපි යවන සෑම අවස්ථාවකම ඒ සම්බන්ධව වගකීමට යටත්වන "අත්සන් කළේ" ලෙස නම් කරන ලද මාණ්ඩලික නිලධාරියා දැනුවත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම ලිපි සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 11. | රාජකාරී ලිපි සඳහා පිළිතුරු යැවීම සම්බන්ධව | සේවා ලාභීන් වෙතින් ඉදිරිපත් වන ලිපි සඳහා පිළිතුරු යැවීමේ ප්‍රමාදයක් තවදුරටත් දක්නට ලැබෙන බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව නිරන්තරව තැපැල වෙත ලැබෙන හා යවන ලිපි සම්බන්ධයෙන් අවදානයෙන් සිටින ලෙස සියලුම ලේකම්වරුන් වෙත දන්වා සිටි අතර , එසේ පිළිතුරු නොලැබුණු ලිපි සම්බන්ධ තොරතුරු ඊළඟ ලේකම්වරුන්ගේ රැස්වීම්වලට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 12. | අමාත්‍ය මණ්ඩල සන්දේශ සම්බන්ධව ආණ්ඩුකාරතුමා වෙත ලිපි ඉදිරිපත් කිරීම සම්බන්ධව | අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් ලේකම්වරුන්ගේ නිරීක්ෂණ හා නිගමන ප්‍රධාන ලේකම්ගේ අධීක්ෂණයෙන් තොරව සෘජුව ආණ්ඩුකාර ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු නොකරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 13. | බස්නාහිර පළාත් සභාව සඳහා ඉන්ධන ලබා ගැනීමට පාරිභෝගික ඒකක (Consumer point) දෙකක් ලබා ගැනීම සම්බන්ධව | පළාත් සභාවේ නිලධාරීන්ගේ ඉන්ධන ගැටළුවට පිළියමක් වශයෙන් පළාත් සභාව වෙනුවෙන් ඉන්ධන ලබා ගැනීමට පාරිභෝගික ඒකක (Consumer point) දෙකක් ලබා ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.ඒ අනුව ප්‍රමාණවත් පරිදි පාරිභෝගික ඒකක (Consumer point) දෙකක් වෙන්කර ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| **14.** | වෙස්ප්‍රෝ ආරක්ෂක අංශ සේවා මුර සම්බන්ධව | පවතින තත්ත්වය අනුව ගමනාගමන අපහසුතා හේතුවෙන් විශේෂ අවස්ථා වලදී වෙස්ප්‍රෝ ආරක්ෂක අංශයට අඛණ්ඩව සේවා මුර හතරක් සඳහා පැය 36 ක සේවා කාලයක් ලබා දිමට පළාත් සභා ගොඩනැගිල්ලේ ආරක්ෂක අංශ වෙත අවසර ලබා දී ඇත . එම සේවා සපයන අනිකුත් ආයතන වලට එසේ සිදු කිරීමට අවසර ඉල්ලා සිටින බවට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව පවතින තත්ත්වය අනුව සුවිශේෂී අවස්ථා වලදී එසේ ක්‍රියා කිරීමට අවසර ලබා දීම සුදුසු බව තීරණය කළ අතර , එසේ වුවද මෙම සියලුම ගොඩනැගිලිවල හා දේපළවල ආරක්ෂාව විධිමත්ව තහවුරු කිරීම අවශ්‍ය බවටද ඔවුන්ට ලිඛිතව දන්වන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.